00328

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## ස්වභාවික විද්‍යා පීඨය

## B.Sc./ B. Ed. උපාධි පාඨමාලාව

| | |
|---|---|
| දෙපාර්තමේන්තුව: | උද්භිද විද්‍යා |
| මට්ටම: | 03 මට්ටම |
| විභාගයේ නම: | අවසාන විභාගය |
| පාඨමාලා මාතෘකාව : | විද්‍යාව හා තාක්ෂණයේ ආචාරධර්ම(FNU3200/PCU1101) |
| අධ්‍යයන වර්ෂය : | 2020/2021 |
| දිනය : | 13. 03. 2022 |
| වේලාව : | පෙ.ව. 09.30 - පෙ.ව. 11.30 |
| කාලය : | පැය දෙකයි (02) |

පොදු උපදෙස් මාලාව :

1. ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමට පෙර සියලුම උපදෙස් හොඳින් කියවන්න.
2. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 6 කින් සමන්විත වන අතර එය පිටු 2 කින් සමන්විත වේ.
3. ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු ලැබේනු ඇත.
4. සෑම ප්‍රශ්නයකටම පිළිතුරු නව පිටුවකින් ආරම්භ විය යුතුය.
5. අවශ්‍ය සෑම අවස්ථාවකදීම සම්පූර්ණයෙන්ම නම් කරන ලද රූප සටහන් සපයන්න.
6. විභාග වරදක් ලෙස සලකන ඕනෑම ක්‍රියාවකට සම්බන්ධ වීම දඬුවම් ලැබීමට හේතු වේ.
7. ප්‍රශ්න වලට පිළිතුරු දීමට නිල් හෝ කළු පෑනක් පමණක් භාවිතා කරන්න.
8. ඔබගේ විභාග අංකය, පිළිතුරු පත්‍රයේ පැහැදිලිව සඳහන් කරන්න.

---

1. (a) "සමාජානුයෝජනය" යන පදය නිර්වචනය කරන්න.

   (b) විශ්වවිද්‍යාලයට අලුතින් බඳවා ගන්නා සිසුන් එහි උප සංස්කෘතියට සමාජානුයෝජනය වීම සඳහා බලපාන ප්‍රධාන සාධක කෙටියෙන් දක්වන්න.

   (c) සදාචාරාත්මක මූල ධර්ම පාදක කර ගනිමින්, විශ්ව විද්‍යාලය තුල පවතින "නවක වදය", අලුතින් බඳවා ගන්නා සිසුන් විශ්වවිද්‍යාලීය උප සංස්කෘතියට සමාජානුයෝජනය වීමේදී බලපාන ආකාරය විස්තර කරන්න.

2. පහත සඳහන් කරුණු පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (a) Kohlberg (1981) ගේ සදාචාර සංවර්ධන න්‍යාය

   (b) සාරධර්ම (value) පිළිබඳව ස්වයං දැනුවත් භාවයේ (self awareness) වැදගත්කම

   (c) ප්‍රකාශන හිමිකම් නීතිය හා ආචාර ධර්ම

3. "නවීන විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව මානව වර්ගයාගේ සදාචාරාත්මක හා සාරධර්ම පද්ධතිවල තියුණු වෙනස් වීම් ඇති කර ඇත." පහත සඳහන් උප මාතෘකා යටතේ මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කරන්න.

   (a) ආදී විද්‍යාඥයින් සහ දාර්ශනිකයන්, මානව අවබෝධය සහ ආචාර ධර්ම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත.
   (b) ලෝකයේ ආචාර ධර්ම පද්ධතීන් වෙනස් කිරීමට හේතු කාරක වූ ප්‍රධාන සිදුවීම්.
   (c) විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව හේතුවෙන් හටගත් අභියෝගයන් තුළ, සදාචාරාත්මක හා සාරධර්ම හර පද්ධතීන් ආරක්ෂා කරනු වස් ලෝක ප්‍රජාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග.

4. වෛද්‍ය ආචාර ධර්ම මත පදනම්ව පහත කොටස් සඳහා පිළිතුරු සපයන්න.

   (a) වෛද්‍ය ආචාර ධර්ම තුල "සබැඳියාවන් අතර ගැටුම්" (conflict of interest) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ?
   (b) වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ "සබැඳියාවන් අතර ගැටුම්" ඇතිවිය හැකි අවස්ථාවන් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (c) සබැඳියාවන් අතර ගැටුම් රෝගීන්ට ප්‍රතිකාර කිරීම කෙරෙහි, සෘණාත්මකව බලපාන ආකාරය පැහැදිලි කරන්න.

5. (a) සායනික පරීක්ෂණ ක්‍රියාවලීන්ගේ ප්‍රධාන පියවරවල් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (b) මිනිසුන් සහ සතුන් උපයෝගී කරගනිමින් සිදුවන වෛද්‍ය පර්යේෂණයන් සඳහා අදාල වන සදාචාරාත්මක කරුණු විස්තර කරන්න.
   (d) සුදුසු උදාහරණ සහිතව කෘෂිකර්මාන්තයේදී හා ආහාර නිෂ්පාදනයේදී සිදුවන සදාචාර විරෝධී තත්ත්වයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "ශ්‍රී ලංකාවේ නව නිමැවුම් කරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම " පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා පාසල් නව නිමැවුම් කරුවන්ගේ සංගමයක් විසින් ප්‍රධාන කථිකයා ලෙස ඔබට ආරාධනය කර ඇතැයි උපකල්පනය කරන්න. ඒ සඳහා අදාළ වූ විස්තරාත්මක දළ සටහනක් පහත සඳහන් කරුණු වලට අදාළ වනසේ සකස් කරන්න.

   (a) නව නිමැවුම් සඳහා වූ නීතිමය ආරක්ෂාවේ අයිතිවාසිකම් සුරැකීමට අදාළ වූ මූලික අවශ්‍යතාවයන්
   (b) නව නිමැවුම් කරුවන් හා නව නිමැවුම් සඳහා ලබාදී ඇති ආරක්ෂාවේ,අයිතිවාසිකම් වල ස්වභාවය
   (c) තරඟකාරී ව්‍යාපාරික ලෝකයේ සිදුවිය හැකි නව නිමැවුම් වලට අදාළ උල්ලංඝනය වීම්
   (d) නීතිමය ආරක්ෂාව ලබාදීමට සුදුසුකම් නොලබන නිෂ්පාදන
   (e) නවීන විද්‍යාත්මක වර්ධනය සමඟ නව නිමැවුම් සුරැකීම සඳහා අනාගත ආරක්ෂක උපාය මාර්ග යෝජනා කරන්න.

හිමිකම් ඇවිරිණි.